


# ලෝකෙන් උතුම් රට



දැනට වසර හතළිහකට පමණ පෙර සිංහල පාඨකයා අතට පත් වූ ලෝකෙන් උතුම් රට නම් පොතමතක ඇති කීදෙනෙක් සිටිත්ද යන්න මට කිව නොහැකිය. ප්‍රකට භාෂා විශාරදයකු වන ආචාර්ය හරිශ්චන්ද්‍ර විජේතුංගගේ සොහොයුරු මහාචාර්ය කරුණාරත්න විජේතුංග ලියූ සමාජ විග්‍රහය 1950 ගණන් වල අපතට පත් ඩී ආර් ජයවර්ධනගේ සමාජ සන්දර්ශය බඳු වූවක් බව මට මතකය.

අද එවැනි පොත් ලියන මහැදුරන් නැති පාටය. සිටිනවා නම් ඔවුන්ට ලිවීමට අනන්ත මාතෘකා හා වික්‍රම දිනපතා ශ්‍රී ලංකාද්වීපයෙන් සොයා ගත හැකිය. 2016 නත්තල වෙනුවෙන් ගාලු මුවදොර පිටියේ ඉදි කරන ලද ලෝකයේ උසම නත්තල් ගස ඒ වාගේ වික්‍රමයකි. වෙනත් වචනයෙන් කිවහොත් පුස්සකි.

අපට දුර සිට දැනගැනීමට ලැබෙන අල්පමාත්‍ර තොරතුරු හා ඕපාදූප ආශ්‍රයෙන් අපට වටහා ගත හැකිවන තත්වය අතිශය අගනා - අති විශිෂ්ට - ජයග්‍රහණ හා වීර ක්‍රියාවන්ගෙන් අනූන බව පමණක් කීම සෑහෙයි.

ඉතාම ආසන්න විජයග්‍රහණය මානෙල්වත්ත විහාරස්ථානයෙන් ය. ජේ ආර් ජයවර්ධන පවුල විසින් පරිත්‍යාග කරන ලද ඒ පුණ්‍ය භූමියේ ඉදිකරන ලද විහාරස්ථානයට අද ලෝකයේ උසම ධම්මචක්ක මුද්‍රාව සහිත බුද්ධ රූපය - පිළිම වහන්සේ - හිමිව ඇති බව වාර්තා කරන ලද්දේ 2017 ජනවාරි මස 19 දින ලංකාදීප පත්තරයයි. එහි දැක්වෙන පින්තූරයේ අගමැති සහ ඔහුගේ බෑනා ද සංඝයා වහන්සේට පූජා කරන පුද පඬුරුද පෙන්නුම් කර තිබුණි.

අපි අපේ වාරය එනතෙක් බලා සිටිමු.

අමතකවීමට කලින් ඒ පිළිබඳව දත යුතු විස්තර ටිකක් ලියා තැබිය යුතුමය. පිළිමයේ උස අඩි 40 කි. බර ටොන් 20 කි. පස්ලෝවලින් ඉදි කොට රන් ආලේප කරන ලද ප්‍රතිමා වහන්සේ නැරඹීමට දැන් පෝලිමේ සෙනග එන බව අපට සිතා ගත හැකිය. පාඩුවක් වෙතොත් කැළණි පෙරහැරටය.

අපේ මව්බිම කප් ගහන්නේ ක්‍රිකට් ක්‍රීඩවෙන් පමණක් නොවන බවට තවත් නිදසුනක් බුද්ධ ශාසන අමාත්‍යංශයේ අනුග්‍රහයෙන් දැන් දැන් ඉදි වෙමින් පවතින බව 2017 ජනවාරි 13 දින අද පත්තරයේ වාර්තා විය. එයත් එසේ මෙසේ එකක් නොවේ. නේපාලයෙන් ආනයනය කරන ලද්දකි. ආනයනයක්ම නොව එරට ඇති නුවරක් අනුව තනනු ලබන ආකෘතියකි.

ධනවත් දිවයිනක් වන සිරි ලක්දිවට දරා ගත හැකි ඇඟට නොදැනීම වැය කළ හැකි බර පැනක් රජය විසින් ඒ සඳහා වැය කරනු ලබන බවද වාර්තාවෙයි. අරනායක සහ කොස්ගම නිවාස අහිමිවූවන්ට තව ටිකක් ඉවසන්නට ඉඩ දී යහපාලනයේ පාලකයන් විසින් කරනු ලබන මේ පුණ්‍යකර්මය කපිලවස්තුපුරය මෙරට කහපොළ පෙදෙසේ රෙඩ්ඩිමෙල් වත්ත නම් හරියේ අක්කර 78 ක භූමිභාගයක ඉදි වන පුණ්‍යකර්මයක් බවද කියනු ලැබේ.

වැඩි මුදල් වියදම් කිරීම අනවශ්‍යය. රුපියල් මිලියන 500 ක් වැනි සොච්චමක් පමණි. එය අපට පුරුදු බාසාවෙන් කියතොත් රුපියල් කෝටි පනහකි. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජාතික ධනය අපරාදේ නාස්ති කළ බවට චෝදනා කරන්නේ මේ ආකාරයේ වැඩ කරන යහපාලකයන්ය.

ඕවිටිගල බැතිමතුන් ඉදි කළ පන්දම් ගහ - පන්දම් රුක නොහොත් පාන් රුක ගැන දන්නා අපට මෙයත් මොන කජ්ජක්ද?

ලෝකෙට පරකාසේ කියන කතාව අපේ මුතුන් මිත්තන් විසින් කට කහනවට කියන ලද එකක් නොවේ. මේ කියන මහ නගර නිර්මාණය සිදු කරන්නේ 2017 ජනවාරි 17 දින ආරම්භ කිරීමට නියමිත ශ්‍රී ලංකාවේ සැමරෙන ජාත්‍යන්තර දින උළෙල නිමිතිකොට ගෙන බවද ඒ වාර්තාවේ සඳහන් කර තිබුණෝය.

සිදුහත් කුමරා නිවන් යන ගමන පටන් ගත්තේ කපිලවස්තු පුර අත්හැර දමා පිටවීමෙන් ය. අපේ සැදැහැවත් උදවිය ඒ ගමන පටන් ගන්නට හදන්නේ උන්වහන්සේ අතහැර දැමූ තැන සිටය. දැන් ඒ නගරයේ ඉතිරිව ඇත්තේ ගඩොල් තාප්ප කිහිපයක් පමණක් බව කියා දීමට දඹදිව බාරකාර සඟරුවන සමත් නොවුණෝද?

ඊළඟට මම ඉංගිරිසි පත්තරයක් අල්ලා ගනිමි. 2017 ජනවාරි 03 දින දි අයිලන්ඩ් පුවත්පත. එහි එන වාර්තාව සපයන්නේ ලන්ඩන්වාසී සුජීව නිවුන්හැල්ල නමැති සිංහලයෙකි. ඒ වාර්තාවත් ස්මාරකයක් ඉදි කිරීම පිළිබඳවය. ස්මාරකය නැසීගිය විරුවන් වෙනුවෙන්ය. ශ්‍රී ලංකාවේදී සිය උරුමයෙ නොහොත් දේශය වෙනුවෙන් දිවි පිදූ කොටි සංවිධානයේ සාමාජිකයන් සිහි කරනු පිණිසය. සමරුව ඉදි කරන භූමිභාගය අක්කර 24 කි. වැය වන මුදල පවුම් මිලියන 1.4 කි. පවුම් කෝටියකුත් ලක්ෂ 40 කි.

උතුරුකරයේ ජනතාවට උදේ හවා පෙනෙන ආකාරයට - ඔවුන් තුළ ඉමහත් ප්‍රසාදයක් ජනිත කරන ආකාරයට - හසලක වීරයාගේ ප්‍රතිමාවක් ඉදි කළ ජාතික නායකයන්ට මේ මේ ස්මාරකද පෙනී යා යුතුය.ඔවුන්ට කළ හැකි හෝ ඔවුන් කරන දෙයක් ඇතුවාට හෝ නොවෙයි.

නැවත වතාවක් ගම රට බලා යාමට ඉඩ ගත යුතු නිසා මම තව එක් නිදසුනක් පමණක් ඉදිරිපත් කොට මගේ ලිපිය හමාර කරන්නෙමි. ඔය කියාපු ඔක්කෝටමට වඩා ඉස්තරම් එකකි. ලෝකයේ ආගමට ලැදිම ජනතාව සිටින රට කුමක්ද යන ප්‍රශ්නය අසන කිසිවෙක් පිළිතුර වශයෙන් ශ්‍රී ලංකාව යන නම ඇසීමට බලාපොරොත්තු වෙත්ද? ඒ ඉහළම තැන අපේ මව්බිමට අහිමි වෙලා ය. ඒකත් නරකම නැත. ඊළඟ තැනට එන්නේ සිරි ලංකාවය. කවුද මුල් පුටුව අල්ලාගත්තේ?

ඒකත් හොඳ ප්‍රශ්නයකි. මුළටම එන්නේ අප්‍රිකාවේ රටක් වන නයිජර් නම් දේශයයි. ඒ නම ඇසූ කීදෙනෙක් ලංකාවේ ඇද්ද? නම ඇසීම අවශ්‍ය නැත. ශ්‍රී ලංකා දේශප්‍රේමීන්ට - එරට මෙරට දෙරටේම වාසය කරන - හොඳ අවසරයක් ඒ විනිශ්චයට එළැඹුණ සංවිධානය ලබා දී ඇත. සංවිධානයේ නම සඳහන්වන්නේ ඉංගිරිසියෙනි. WIN - GIA

දේවෝ වස්සතු කාලේන
රාජා භවතු ධම්මිකෝ...

**සිදුහත් කුමරා නිවන් යන ගමන පටන් ගත්තේ කපිලවස්තු පුර අත්හැර දමා පිටවීමෙන් ය. අපේ සැදැහැවත් උදවිය ඒ ගමන පටන් ගන්නට හදන්නේ උන්වහන්සේ අතහැර දැමූ තැන සිටය.**

